# වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 2 දරණ වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍ය අරමුදල පිළිබඳ ප්‍රඥප්තිය.

************************************

වයඹ ආණ්ඩුකාර තුමා අනුමතිය දුන් දිනය :- 1990.05.29

වයඹ පළාත තුළ දරිද්‍රතාවයට සහන සැලසීම සඳහා ද, අධ්‍යාපනය හෝ ඥානය වර්ධනය කිරීම සඳහාද, ආගම නංවාලීම සඳහාද, වයඹ පළාත වෙනුවෙන් සේවයක් කර ඇති තැනැත්තන්ට ප්‍රදානයක් කිරීම සඳහාද, වයඹ පළාතේ මහජනතාවගේ සුභසිද්ධිය හෝ යහපත පිණිස වූ වෙනත් යම් කාර්ය සඳහාද මුදල් සැපයීම පිණිස "වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍ය අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික හෝ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

කෙටි නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1. මේ ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 2 දරණ "වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍ය අරමුදල පිළිබඳ ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනයේ සිට එය ක්‍රියාත්මක වන්නේය.

ප්‍රධාන අමාත්‍ය අරමුදලක් පිහිටුවීම.

2. (1) මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන "වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍ය අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටවනු ලැබේ.

(2) (1) වන උප වගන්තියෙන් අරමුදලට දී ඇති නාමයෙන් ඒ අරමුදල අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතුය. තවද එකී නාමයෙන් අරමුදල විසින් නඩු පැවරීමද, අරමුදලට විරුද්ධව නඩු පවරනු ලැබීමද කරනු ලැබිය හැකිය.

අරමුදලෙහි පාලක මණ්ඩලය.

3. (1) අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට සමන්විත වන පාලක මණ්ඩලයක් සතු වේ.

(2) මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන අරමුදලේ පාලක මණ්ඩලය -

(අ) වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා,

(ආ) වයඹ පළාතේ මුදල් විෂය භාර අමාත්‍යවරයා හෝ එම අමාත්‍යවරයා ප්‍රධාන අමාත්‍යවරයා වේ නම් ප්‍රධාන අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන පළාත් අමාත්‍ය මණ්ඩලයේ වෙනත් අමාත්‍යවරයෙක්,

(ඇ) වයඹ පළාතේ පළාත් සභාවේ සභාපතිවරයා,

(ඈ) වයඹ පළාතේ පළාත් සභාවේ විරුද්ධපක්ෂයේ නායකවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්,

....02

(ඉ) වයඹ පළාතේ ප්‍රධාන ලේකම්වරයා සහ

(ඊ) වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නාවූද, ප්‍රධාන අමාත්‍යවරයා විසින් එක් එක් තැනැත්තා වෙත නිකුත් කරනු ලබන පත්වීම් ලිපියෙහි සඳහන් කරනු ලබන යම් කාලයක් සඳහා ඒ එක් එක් තැනැත්තා විසින් (3) වන සහ (4) වන උප වගන්තිවල විධිවිධාන වලට යටත්ව ධුරය දැරිය යුතු වූද, වෙනත් සාමාජිකයන් දෙදෙනෙක් යන අයගෙන් සමන්විත විය යුතුය.

(3) ප්‍රධාන අමාත්‍යවරයා විසින් (2) වන උප වගන්තියේ (ඊ) ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් සාමාජිකයෙකුගේ පත්වීම, ප්‍රධාන අමාත්‍යවරයා විසින් තම අභිමතය පරිදි ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකිය.

(4) (2) වන උප වගන්තියේ (ඊ) ඡේදය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ යම් සාමාජිකයකුට, තමා ඉල්ලා අස්වන බවට වූ ලිපියක් ප්‍රධාන අමාත්‍යවරයා අමතායැවීමෙන් ඕනෑම අවස්ථාවකදී මණ්ඩලයෙන් ඉල්ලා අස්විය හැකිය.

(5) මණ්ඩලයේ රැස්වීම් හා එම රැස්වීම් වලදී කටයුතු කිරීම පිළිබඳ කාර්ය පරිපාටිය මණ්ඩලය විසින් විධිමත් කර ගනු ලැබිය හැකිය.

(6) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබූ පමණින් හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහි යම් දෝෂයක් තිබූ පමණින් ශහ් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත නොවන්නේය.

(7) ප්‍රධාන අමාත්‍යවරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතුය.

4. මණ්ඩලයට, අරමුදලෙහි නාමයෙන් – මණ්ඩලයේ බලතල.

(අ) චංචල හෝ නිශ්චල දේපල අත්කර ගැනීමේ, දැරීමේ හෝ පාලනය කිරීමේ ;

(ආ) අරමුදලට හිමිකම් ලැබෙන යම් චංචල හෝ නිශ්චල දේපලක් විකිණීමේ, උකස් කිරීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීමේ නැතහොත් ඒ දේපල සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ;

(ඇ) මේ පනතේ විධිවිධාන බල ගැන්වීම පිණිස අවශ්‍ය සියලු ක්‍රියා හෝ සියලු දේ කිරීමේ

බලය තිබිය යුතුය.

.....(03

**ප්‍රධාන අමාත්‍ය අරමුදලේ ගිණුම.**

5. (1) "වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍ය අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන ගිණුමක් මණ්ඩලය විසින් රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යා යුතුය.

(2) අරමුදලට –

(අ) දීමනා, ප්‍රදානයන් හා තෑගි වශයෙන් ලැබෙන මුදල් හා,

(ආ) පළාත් සභා අරමුදල් වලින් ගෙවනු ලැබිය හැකි මුදල් සහ,

(ඇ) වෙනත් ප්‍රභව වලින් ලැබිය හැකි මුදල්,

ගිණුමට බැර කළ හැකිය.

**අරමුදලේ මුදල් යොදනු ලැබිය හැකි කාර්යය.**

6. අරමුදලට අයත් මුදල්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට –

(1) වයඹ පළාත තුළ දරිද්‍රතාවයට සහන සැලසීම සඳහා හෝ

(2) වයඹ පළාත් තුළ අධ්‍යාපනය හෝ ඥානය වර්ධනය කිරීම සඳහා ; හෝ

(3) වයඹ පළාත් තුළ ආගම තංවාලීම සඳහා හෝ ආගමික වත් පිළිවෙත් පවත්වාගෙන යාම සඳහා ; හෝ

(4) වයඹ පළාත වෙනුවෙන් සේවයක් කර ඇති තැනැත්තන්ට ප්‍රදානයක් කිරීම සඳහා ; හෝ

(5) ප්‍රධාන අමාත්‍යවරයාගේ හා මණ්ඩලයේ මතය අනුව, වයඹ පළාතේ මහජනතාවගේ සුභසිද්ධිය හෝ යහපත පිණිස වූ වෙනත් යම් කාර්යයක් සඳහා ; හෝ

ප්‍රධාන අමාත්‍යවරයාගේ විධාන වලට යටත්ව යොදා ගැනීම මණ්ඩලයේ වගකීම විය යුතුය.

**අරමුදලේ මුදල් ආයෝජනය කිරීම.**

7. අරමුදලට අයත් යම් මුදලක් ප්‍රධාන අමාත්‍යවරයා විසින් දෙනු ලබන යම් විධාන වලට යටත්ව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබිය හැකිය.

**අරමුදලෙහි නිලධරයෝ සහ සේවකයෝ.**

8. ප්‍රධාන අමාත්‍යවරයාගේ විධාන වලට යටත්ව මණ්ඩලයට –

(1) අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වන අරමුදලේ යම් නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට ;

.....04

(2) එසේ පත් කරන ලද නිලධරයන්ට හා සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික නියමය කිරීමට ;

(3) ඒ පාරිශ්‍රමික සහ අරමුදලේ කටයුතු පරිපාලනය කිරීමෙහි ලා දරන ලද සියලු වියදම් අරමුදලේ ආදායමෙන් ගෙවීමට,

බලය තිබිය යුතුය.

9\. (1) අරමුදලේ ආදායම් හා වියදම් පිළිබඳ ගිණුම් තැබීමට මණ්ඩලය විසින් සැලැස්විය යුතුය. විගණනය සහ ගිණුම්.

(2) අරමුදලේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයෙකු ලවා විගණනය කිරීමට සැලැස්විය යුතු අතර, එකී විගණකවරයා ආදායම් සහ වියදම් වාර්තාවක් සමඟ පසුගිය අවුරුද්ද තුළ අරමුදලේ කාර්යයන් පරිපාලනය කිරීම ගැන වාර්තාවක් පිළියෙල කළ යුතුය.

(3) මණ්ඩලය විගණකවරයාගේ වාර්තාව ලැබුන පසු ප්‍රායෝගික වශයෙන් කළහැකි වහාම පසුගිය වසරේ අරමුදලේ ක්‍රියාවන් පරිපාලනය පිළිබඳ තම වාර්තාව, විගණකවරයාගේ වාර්තාව සමඟ ප්‍රධාන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළයුතු වේ. ප්‍රධාන අමාත්‍යවරයා එම වාර්තාව පළාත් සභාව ඉදිරියේ තැබිය යුතුය.

(4) මෙම වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යනුවෙන් අදහස් වන්නේ,

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවනු ලැබූ වෙනත් ආයතනයක සාමාජිකයකුවූද, ඒ ආයතනයේ සභාව විසින් ගණකාධිකාරිවරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට නිකුත් කරන ලද සහතිකයක් දරන්නාවූද, තැනැත්තෙක් හෝ,

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයෙකුව සිටින්නේද එමෙන්ම ගණකාධිකාරිවරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් වේ.

**රීති සෑදීමට මණ්ඩලයට ඇති බලය.**

10. මණ්ඩලයේ බලතල, කර්තව්‍ය හා වගකීම් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා බල ගැන්වීම කෙරෙහි බලපෑ හැකි සම්බන්ධිත හෝ ආනුෂංගික වූ කිසියම් කරුණක් සම්බන්ධයෙන් අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන රීති මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකිය.

**අර්ථ නිරූපණය.**

11. මෙම ප්‍රඥප්තියෙහි "රාජ්‍ය බැංකුව" යන පදයෙන් ලංකා බැංකුව හා මහජන බැංකුව අදහස් කෙරේ.

**********************